www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජාතීන්ගේ "දරිද්‍රතා සමුලුව" ලෝක ධනවාදයේ බංකොලොත්කම හෙලි කරයි

## UN "poverty summit" exposes failure of world capitalism

2010 සැප්තැම්බර් 23

එක්සත් ජාතීන්ගේ මූලස්ථානයෙහි බදාදා පැවති "දරිද්‍රතා සමුලුව" ග්‍රහ ලෝකය පුරා බිලියන සංඛ්‍යාත ජනතාව මුහුන දෙන දරිද්‍රතාව හා සාගින්න සම්බන්ධයෙන් ධනවාදය මත පැවරෙන වගකීම හෙලි කිරීම සඳහා ප්‍රයෝජනවත්ය. මෙම කොන්දේසි හොඳ අතට හැරවීම සඳහා පසු ගිය දශකය පුරා එක්සත් ජාතීන් සහ ප්‍රධාන බලවතුන් ප්‍රතිඥා දුන්නත් සිදුව ඇත්තේ, අධිරාජ්‍යවාදී කොල්ල කෑමේ හා ගෝලීය මූල්‍ය අර්බුදයෙන් ඇති වුනු කම්පනයේ ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ පීඩිත ම කොටස්වල අපේක්ෂා භංගත්වය සහ දුක් කම්කටොලු වඩා උග්‍ර වීම පමනි.

අදින් හරියට ම දස වසරකට පෙර සම්මත කර ගත් ඊනියා සහස්‍රක ඉලක්ක කෙරෙහි සිය කැප වීම නිව් යෝක් නගරයේ එක්සත් ජාතීන්ගේ මහා මන්ඩලයේ මෙවර පැවති රැස්වීම ඉදිරිපිට ද පල කරනු වස්, රාජ්‍ය නායකයෝ ගනනාවක් පුරාජේරු කතා ඇදබෑවෝය.

අන්ත දරිද්‍රතාව, සා ගින්න, ලමා සහ මාතෘ සෞඛ්‍යය සහ අනෙක් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් යෝජිත ඉලක්ක කරා 2015 වන විට ලඟා වීමේ කාල නියමය පරිදි, ඒවා සපුරාලීම සිහිනයක් බව දැනට මත් ගතවී ඇති දස වසරක කාලයේ ප්‍රගතිය දෙස බැලූවිට පෙනී යන්නේ යයි වඩාත් අව්‍යාජ ප්‍රකාශවලින් පිලිගෙන තිබේ.

ඉලක්කවලින් පෙන්නුම් කෙරුනේ, ලාභ පද්ධතිය ලෝක ජනගහනයේ බහුතරය ඇද දමා ඇති දරිද්‍රතාවේත් පීඩනයේත් දුෂ්ටතම ලකුනු මුලිනුපුටා දැමීමට කැප වීමකි. ඒත් ඒවා මුදුන් පමුනුවා ගැනුනත් බිලියන සංඛ්‍යාත ජනයා සාගින්නෙහි ද දුක් කම්කටොලුවල ද ගිලී සිටිනු නියත ය.

සහස්‍රක සංවර්ධන ඉලක්ක සම්මත කර ගත් අවස්ථාවේ එක්සත් ජාතීන් "සහස්‍රක ප්‍රකාශනයට" අනුමැතිය දුනි. "අද දින අප පොදුවේ මුහුන දෙන අභියෝගය නම් ගෝලීයකරනය මුලු ලෝකයේ ම ජනතාවට වැඩදායක බලවේගයක් වෙමින් තිබෙන බව සහතික කිරීම" යයි ඉන් ප්‍රකාශ විය.

ගෙවී ගිය අතරමැදි දශකය මෙම ප්‍රකාශය පරිහාසයට ලක් කර තිබේ. ප්‍රකාශනය මුල සිට ම මාන බැලුවේ ලෝක මූල්‍ය ප්‍රාග්ධනය විසින් පීඩිත ම රටවල් සූරා කෑම සූක්ෂ්ම ලෙස වසං කිරීමට යි.

තාක්ෂනයේ, නිෂ්පාදනයේ සහ සන්නිවේදනයේ ඉමහත් වර්ධනයකට අවස්ථාව සලසා දෙමින් ආර්ථිකය ගෝලීයව ඒකාග්‍ර වී තිබෙන මුත් එය බැංකුවල සහ සංගතවල ලාභවලටත්, තුනී මූල්‍ය කතිපයාධිකාරයක් අත දූෂිත ලෙස මහා ධනස්කන්ධයක් ගොඩ ගසා ගැනීමටත් යටවී ඇත.

ලෝකයේ දිළිඳු ජනතාවට ධනවාදී ගෝලීයකරනයේ අර්ථය වන්නේ, මහා ව්‍යසන මාලාවක් සහ කිසි කලක නොවූ ලෙස වැඩෙන සමාජ අසමානතාව යි. තොග පිටින් පෞද්ගලීකරනය ද ගෝලීය වෙලඳ භාන්ඩ සමපේක්ෂනය ද සමඟ බැඳුනු ධනේශ්වර කෘෂිකර්මයේ ගෝලීයකරනයෙන්, තවත් මිලියන සිය ගනනක් ජනතාව ගොඩ ඒ ගත නොහැකි සාගතයක ගිල්වා දමන ආහාර අර්බුදයක් නිර්මානය කර තිබේ.

"අන්ත දරිද්‍රතාව සහ කුසගින්න මුලිනුපුටා දැමීම" ලෙස හැඳින්වුනු පලමු සහස්‍රක ඉලක්කයේ ශේෂ පත්‍රය වී ඇත්තේ කොන්දේසි අනපේක්ෂිත ලෙස වඩා නරක අතට හැරීමකි. දශකයකට කලින් ඉලක්ක සම්මත කර ගන්නා විට මිලියන 830ක් ජනතාව සාගතයක අද්දර ජීවත් වූහ. ආහාර අර්බුදය හටගත් විට බිලියනය ඉක්මවා නැඟුනු මේ සංඛ්‍යාව දැන් මිලියන 915 මට්ටමේ පවතියි.

ලෝක බැංකුවට අනුව අද දවසේ මිලියන 980ක ජනගහනයකට දිනකට ඩොලර් 1කට අඩු ආදායමකින් ජීවත් වන්නට බල කෙරී ඇත. මෙය, 1990 දී වාර්තා වුනු බිලියන 1.25 මට්ටමෙන් ස්වල්පයක් පසු බැස ඇතිවා පමනකි.

මෙම සංඛ්‍යාව 2015 වන විට අඩකින් කපා හැරීම සහස්‍රක ඉලක්කයේ බලාපොරොත්තුව විය. එහෙත් 2008 දී වෝල් වීදියෙහි ඇරඹුනු අර්බුදය අන්ත දරිද්‍රතාවෙහි ජීවත් වන ජනගහනය ඉහල නංවමින්

ලොව පුරා පැතිර ගොස් ඇත. ලෝක බැංකුවට අනුව 2009 දී තවත් මිලියන 50ක් දෙනා මෙම කොන්දේසිවලට ගොදුරුවුන අතර, 2010 දී තවත් මිලියන 64ක් එම ඉරනමට මුහුනපානු ඇති බවට ගනන් බලා තිබේ.

ප්‍රකාශිත අනෙක් ඉලක්කවල දක්නට ඇත්තේ ද සුලු ප්‍රගතියකි. 2015 වන විට ළදරු මරන සංඛ්‍යාව තුනෙන් දෙකකින් අඩු කිරීම ඉන් එකකි. එහෙත් දශකයකට පසුවත් මිලියන 9.2ක් ළමුන් පස් වන උපන් දිනය පසු කර ජීවත් වන්නේ නැත. බොහෝ කොට ම, මන්ද පෝෂනය සහ වැලක්විය හැකි රෝග නිසා ය.

ඒ සමානවම මාතෘ මරන සංඛ්‍යාව හතරෙන් තුනකින් අඩු කිරීමේ ප්‍රතිඥාව ද යථාර්ථය විසින් බිඳ හෙලා ඇත. ගර්භනී භාවය සහ ප්‍රසූතිය සම්බන්ධ සංකූලතා සෑම වසරක ම පන්ලක්ෂයක් කාන්තාවෝ මරා දමති.

ඒඩ්ස් පැතිරීම නතර කරන්නට එක්සත් ජාතීන් පොරොන්දු විය. එහෙත් දශකයක් ගතවුන තැන ද ප්‍රතිකාර ලබා දීමට හැකිව ඇත්තේ වයිරසය ආසාදිත මිලියන 33.2ක් ජනයාගෙන් තුනෙන් එකකට පමනකි. තව ද, අත්කරගෙන තිබෙන ප්‍රගතිය වෙත ඇඟිල්ල දික් කරමින් ඒඩ්ස් විරෝධී වැඩසටහන් වලට සැපයෙන අරමුදල් කපා හැරෙයි. උදාහරනයකට, යුරෝපා රටවල් එච්අයිවී/ඒඩ්ස් වැඩ සටහන්වලට මේ වසරේ ලබා දෙන්නේ ගිය වසරට වඩා එ.ජ. ඩොලර් මිලියන 623ක් අඩුවෙනි.

දියුනු ධනපති රටවලින් එකක් වත් ලෝකයේ දිළිඳුම කලාපවලට ආධාර කිරීමට දුන් අවම පොරොන්දු පවා ඉටු නොකරයි. 2005 දී ඔවුන් කුම්මැහි ලෙස ජාත්‍යන්තර ආධාර සඳහා තම දල ජාතික ආදායමෙන් සියයට 0.7ක් වෙන් කල ද හත් දෙනාගේ කන්ඩායමේ රටවල සාමාන්‍යය සියයට 0.22ක් පමනකි, එක්සත් ජනපදය වෙන් කරන්නේ සියයට 0.17ක සොච්චමකි.

තම පොරොන්දු කඩකර තිබෙන අතරතුර පවා ප්‍රධාන ධනපති රටවල නායකයන් සමුලුව තුල කතා කලේ, ලෝකයේ පීඩිත ජනතාව දෙසට සිය අධිරාජ්‍යවාදී මහන්තත්ත කම පෙන්වමිනි.

ජර්මානු චාන්සලර් ඇන්ජිලා මර්කල් 2000 දී දුන් පොරොන්දු 21 දින වන විට ඉවත දැමුවා ය. "දස වසරකට පෙර ජාත්‍යන්තර ප්‍රජාව නියමිත ඉලක්ක පිහිටවූහ. අවාසනාවකට මෙන් අද අපට මේ අරමුනු කරා ලඟා වීමට නොහැකි වන බව පිලිගැනීමට සිදුව තිබේ."

මෙම අරමුනු ඉටු කර ගත නොහැකි වීම ගැන ඈ දුප්පත් ම රටවලට චෝදනා කලා ය.

"සීමාවක් නැතුව දිගින් දිගට සංවර්ධන ආධාර දීමේ හැකියාවක් නැතැයි," ඇය අනතුරු ඇඟවූවා ය.

එක්සත් ජනපද ජනාධිපති බැරැක් ඔබාමා ද 22 දින සිය කථාව තුල හඬ නැගුවේ ඒ හා සමාන තේමාවකි. එක්සත් ජනපදයේ ආධාර වැඩසටහන් වොෂින්ටනයේ "ජාතික ආරක්ෂක මූලෝපායට" යටත් යැයි ඔහු මහා මන්ඩලය හමුවේ පැවසී ය.

ජාත්‍යන්තර ආධාර සම්බන්ධයෙන් තම පාලනාධිකාරය "කටයුතු කරන ආකාරය වෙනස් කරමින්" සිටින බව ඔබාමා ප්‍රකාශ කලේ ය. "ඕනෑවටත් වඩා දිගු කාලයක් අප අපේ පරිශ්‍රමයන් මැන බලා ඇත්තේ අප වැය කල මුදල්වලිනි." එවැනි ආධාර "පරාධීනත්වය" උපදවන්නේ යයි හෙතෙම අවධාරනය කලේ ය. මෙය "අප විසින් බිඳ දැමිය යුතු චක්‍රයකි."

තමන් ප්‍රතිඥා දුන් විදේශ ආධාරවලින් කාලකටත් වඩා අඩුවෙන් සපයන රටක නායකයා ලෙස කතා කල ඔබාමා, "අප කොතරම් මුදලක් වැය කරන්නේ ද යන පරන කාලෙ පටු විවාදයෙන් ඔබ්බට යන්නැ"යි එක්සත් ජාතීන්ගේ නියෝජිතයන් හමුවේ නරුම ලෙස කියා සිටියේය.

මතු පිටින් නව ප්‍රවිෂ්ටයක් ලෙස පෙන්නුම් කල ද එක්සත් ජනපද ජනාධිපති කල නිවේදනය තුල අඩංගු වන්නේ, ආධාර සැපයීම ඇමරිකානු මූල්‍ය ප්‍රාග්ධනයේ ආධිපත්‍යයට මුලුමනින් යටත්වන දිළිඳු රටවල් වෙත යොමුකරන බවයි. "ආයෝජන ආකර්ෂනය කර ගන්නා ව්‍යාපාරික වාතාවරනයන් නිර්මානය කිරීමට" සහ "ව්‍යවසායකයන් දිරි ගැන්වීමට" එවැනි රටවලට සිදු වනු ඇතැයි ඔහු අවධාරනය කලේ ය.

වෙනත් වචන වලින් කිව හොත් ඔබාමාගේ නව ප්‍රතිකර්මය, ගෝලීය දරිද්‍රතාවට මග පෑදූ එම විෂ ගුලියම වැඩිපුර ලබා දීමයඃ එනම්, නිර්බාධිත ධනවාදී සූරා කෑම ය.

ධනපති රටවල නායකයෝ තම රටවල වැඩ කරන ජනතාවට එරෙහිව කුරිරු කප්පාදු වැඩ සටහන් පනවමින් සිටිති. මෙම ප්‍රතිපත්ති තර්කානුකූල ලෙසම ග්‍රහ ලෝකයේ පීඩිත රටවල් කරා ව්‍යාප්ත කිරීම යනු ජනතාව සාගතයට ඇද දැමීම ජාවාරමේදී දරන්නට සිදු වන නො වැලැක්විය හැකි වියදමක් ලෙස පිලිගැනීම යි.

ඔවුන්ගේ උද්ධච්ච ඉල්ලීම් පසුපස පවතින්නේ

මෙය යි: ප්‍රධාන ධනපති රටවල් ග්‍රහ ලෝකය තුල ඇති ඓතිහාසිකව පීඩිත කලාප දිගින් දිගට ම කොල්ල කන අතර තුර දිලිඳු රටවල් තමන්ගේ ඉරනමේ සහ "දූෂනයට" එරෙහිව සටන් වැදීමේ "වගකීම භාර ගත යුතුය යන්නයි,"

උදාහරනයකට, උප සහරා අප්‍රිකාව වසරකට ආධාර ලෙස එ.ජ. ඩොලර් බිලියන 10ක් පමන ලබන අතර වෝල් වීදියේ සහ ලන්ඩන් නගරයේ බැංකුවලට නය ගෙවීම් ලෙස එ.ජ. ඩොලර් බිලියන 14කට වඩා ගෙවයි. දූෂනය සම්බන්ධයෙන් කියන්නේ නම්, බුෂ් සහ ඔබාමා පාලනාධිකාරයන් සැපයූ එ.ජ. ඩොලර් ට්‍රිලියන 12කට වැඩි මුදල්වලින් ආධාර ලද, අනුබල ලද සහ ඇප ලබා බේරුනු වෝල් වීදියේ මූල්‍ය සමපේක්ෂකයන්ගේ සාපරාධී ක්‍රියාවල ප්‍රතිවිපාකවලින් මුලු මහත් ග්‍රහ ලෝකය ම පීඩා විඳිමින් සිටියි.

එක්සත් ජාතීන්ගේ සහස්‍රක සංවර්ධන ඉලක්ක සමුලුවෙන් පෙන්නුම්කර තිබෙන්නේ, 1930 ගනන්වලින් මෙපිට හටගත් දරුනු ම ආර්ථික අර්බුදය සඳහා ප්‍රධාන ධනපති බලවතුන්ගේ පිලිතුර, වඩ වඩාත් මිලිටරිවාදයට හා යුද්ධයට සූදානම්වන අතර තුර, ග්‍රහ ලෝකයෙහි සිටින දිලිඳුතම සහ පීඩිත ම ජනතාව ද ඇතුලු වැඩ කරන ජනතාවගේ රැකියා, ජීවන තත්ත්වයන් සහ සේවා කොන්දේසි මත තම ප්‍රහාරය දෙගුන කිරීම බව යි.

සාමාජීය පරිහානියේ මෙම රල පහරට එරෙහිව කම්කරු පන්තිය, තමන්ගේ ජාත්‍යන්තර සමාජවාදය පිලිබඳ ස්වාධීන සහ විප්ලවවාදී ඉදිරි දර්ශනය ඉදිරිපත් කල යුතු ය. ලාභ ක්‍රමයේ රාමුව තුල දරිද්‍රතාව දුරු කල නොහැකි ය.

සෑම රටක දී ම මතු වන ඓතිහාසික කර්තව්‍යය වන්නේ, ධනවාදය අවසන් කර, ලාභයට යට වී තිබෙන නිෂ්පාදනය ඉන් මුදා ගෙන, ලෝක කම්කරු පන්තියේ සහ පීඩිතයන්ගේ අවශ්‍යතා ඉටුකරලිය හැකි පරිදි ගෝලීය ආර්ථිකය ප්‍රතිසංවිධානය කිරීම යි.

**බිල් වැන් ඕකන්**

© www.wsws.org